Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# වත්තල ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වත්තල ප්‍රාදේශීය සභාවේ, පුරප්පාඩුව පවතින මෙම නිවේදනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1 | ආදාහනාගාර ක්‍රියාකරු | 02 | PL2-2016 (රා.ප.ච. 3/2016 උපලේඛන 2 අනුව)<br>රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>8 ශ්‍රේණිය සමත් වී තිබීම.<br>*වෘත්තීය සුදුසුකම් :*<br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N. V. Q.) අවම වශයෙන් 2වන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>(සහතික මගින් සනාථ කළ යුතු ය)<br>*පළපුරුද්ද :*<br>(විවෘත අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ)<br>පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05 සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයෙකු විය යුතු ය. |
| 2 | විදුලි කාර්මික | 01 | PL2-2016 (රා.ප.ච. 3/2016 අනුව)<br>රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450 | *අ.* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග-යේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම.<br>(මින් විෂයයන් පහ(05)ක් එකවර සමත් විය යුතු ය)<br>*වෘත්තීය සුදුසුකම් :*<br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබා ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N. V. Q.) අවම වශයෙන් 2 වන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>(සහතික මගින් සනාථ කළ යුතු ය)<br>*පළපුරුද්ද :*<br>(විවෘත අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ)<br>අදාළ පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05 සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයෙකු විය යුතු ය. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 3 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 04 | PL1-2016 (රා.ප.ච. 3/2016 අනුව)<br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය. |
| 4 | සෞඛ්‍ය කම්කරු | 01 | PL1-2016 (රා.ප.ච. 3/2016 අනුව)<br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය. |
| 5 | රියැදුරු III | 06 | PL3-2016 (රා.ප.ච. 3/2016 අනුව)<br>රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාග යේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02ක්) සහිතව විෂයයන් හයක් (06ක්) සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05ක්) අවම වශයෙන් සමත්ව තිබිය යුතු ය.)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br>පුද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනකට (03කට) පෙර අවම වශයෙන් "ඒ" සහ "සී1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.)<br>සහ<br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු අතර අවම උස අඩි 5ක් විය යුතු ය.<br><br>*පළපුරුද්ද :*<br>බලපත්‍ර ලැබීමෙන් පසු රියැදුරෙකු ලෙස අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම (විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.) |
| 6 | ආයුර්වේද ඖෂධ සංයෝජක | 01 | PL2-2016 (රා.ප.ච. 3/2016 අනුව)<br>රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග-යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02ක්) සහිතව විෂයයන් හයක් (06ක්) සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත්වී තිබිය යුතු ය.)<br><br>*පළපුරුද්ද :*<br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතු ය.) |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 7 | පෙර පාසැල් ගුරු/පෙර පාසැල් පාලිකා | 01 | MN1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 27,140-10x300 - 11x350 - 10x495 - 10x660 - රු. 45,540 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.<br>*වෘත්තීය සුදුසුකම් :*<br>පෙර පාසැල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසැල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06කට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම. |

*බඳවා ගැනීමේ ක්‍රමය :*

- ඉහත අංක 01-02-03-04-06-07 තනතුරු සඳහා මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙන අතර එම තනතුරු වලට අදාළ ප්‍රායෝගික දැනුම පළපුරුද්ද කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය හා පෞරුෂය පිළිබඳ සලකා බලනු ලබන අතර එහි දී වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙලට අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.
- ඉහත අංක 05 දරන තනතුර සඳහා මූලික අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂාවෙන් පසුව වාචික හා ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයක් පැවැත්වෙන අතර එහිදී රිය පැදවීමේ නිපුණතාවය මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම පිළිබඳ පරීක්ෂාවක් සිදු කරනු ලැබේ.

*බඳවා ගැනීම සඳහා වෙනත් සුදුසුකම් :*

- ❖ අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
- ❖ විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
- ❖ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ අවම වශයෙන් වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.
- ❖ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2019.01.31 දිනට) වයස අවු. 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය. (රාජ්‍ය සේවයේ හෝ යම් පළාත් රාජ්‍ය සේවයක දැනටමත් සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
- ❖ දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු නොකරනු ලැබූ හෝ රාජ්‍ය හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු නොලැබූවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම නොලැබූ අයෙකු විය යුතුය.
- ❖ අවශ්‍ය වුවහොත් සභාව විසින් නියම කරනු ලබන ඇපයක් මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් ඇප තැබීමට සූදානම් විය යුතුය.

*සේවයේ නියුක්ත කරවීමේ පොදු කොන්දේසි :*

- මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
  තෝරා ගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
- වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
- පරිවාස කාලය තුළදී පැමිණීම. වැඩ, හැසිරීම, සතුටුදායක වන්නේනම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.
- මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අනුකූලව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද වත්තල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන උපදෙස් පරිදි කටයුතු කිරීමට ද බැඳී සිටිය යුතු ය.
- දිවා හා රාත්‍රී කාලයේ සේවයේ යෙදවීම සඳහා ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් සහිත විය යුතුය. (රජයේ වෛද්‍ය නිලධරයෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයකින් ඒ බව සනාථ කළ යුතුය.)

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

- උප්පැන්න සහතිකය;
- අධ්‍යාපන සහතිකය;
- ජාතික හැඳුනුම්පත;
- ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
- මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්; (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුය.)
- වෙනත් සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :*

- මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව අඟල් 12x8 ප්‍රමාණයේ තමා විසින් පිළියෙල කරගත් අයදුම්පත් 2018.12.14 දිනයට හෝ ඊට පෙර"ලේකම්, වත්තල ප්‍රාදේශීය සභාව, වෙළඳ සංකීර්ණය, කෙරවලපිටිය, හැඳල, වත්තල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයෙන් එවිය යුතුය.
- අතින් ගෙනවිත් දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැලකිය යුතුයි.-*

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. එමෙන්ම ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

කේ. එච්. එස්. අයිරාංගනී,
ලේකම්,
වත්තල ප්‍රාදේශීය සභාව.

2018 ක්වූ ඔක්තෝබර් මස 02 වැනි දින,
වත්තල ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

**වත්තල ප්‍රාදේශීය සභාව**

*................................... තනතුර සඳහා වූ අයදුම්පත්‍රය*

1. *(අ)* මුලකුරු සමග නම :——————————————.
   *(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————
2. පෞද්ගලික ලිපිනය :——————————————
3. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————
4. දුරකථන අංකය :——————————————
5. උපන් දිනය (උප්පැන්න සහතිකය ඇමිණිය යුතුය) :——————————————
6. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට 2019.01.31 දිනට වයස :
7. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————.
8. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :—————————————— .
9. *(අ)* ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද?:—————————————— .
   *(ආ)* එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? :—————————————— .
10. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————————— .
11. විවාහක/ අවිවාහක බව :______ .
12. අධ්‍යාපන සුදුසුකම්/සමත් වී ඇති ඉහළම විභාගය :—————————— (ඡායා පිටපත් ඇමිණිය යුතුය.)
13. *(අ)* පළපුරුද්ද සහ වෘත්තිය සුදුසුකම්:——————————
    *(ආ)* වෙනත් සුදුසුකම්:—————————————— .
14. *(අ)* ඔබට කුමන හෝ වරදකට අධිකරණයකින් දඬුවම් පනවා තිබේ ද? :——————
    *(ආ)* එසේ නම් දඬුමේ ස්වභාවය :—————————————— .
15. ඔබ දැනට මෙම සභාවේ සේවය කරන්නේ නම් සේවා කාලය සේවා විස්තරය හා තනතුරේ
    ස්වභාවය :—————————————— .
    (අනියම්, ස්ථිර නොවන ආදේශක, ගිවිසුම් පදනම් මත, ව්‍යාපෘති පදනම)

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මෙම තනතුරට මා තෝරා ගැනීමට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

—————————— .
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................................................ මහතා/මහත්මිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ............... දින සිට ............... දින දක්වා .............................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් මුදාහල හැක/ නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) භාජනය වී නොමැති බව මෙයින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර/ නොකර ඉදිරිපත් කරමි.

——————————.
ආයතනයේ ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :——————.